# පුරාණ ශ්‍රී ලංකාවේ වියළි කලාපීය ජල කළමනාකරණයේ සුවිශේෂිතාව හඳුනාගැනීම

චන්දන රෝහණ විතානාච්චි

*පුරාවිද්‍යාව හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය*
*ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය*

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ පුරාණ ශිෂ්ටාචාරයේ අනන්‍යතාව ප්‍රකට කරවන ප්‍රධාන සාධකයක් වන්නේ ඊට උරුම වූ වාරි සංස්කෘතිය යි. වී වගාව ප්‍රධාන කොටගත් පැරැන්නන් සිය ජනාවාස සඳහා වඩාත් යෝග්‍ය භූමිය ලෙස තෝරාගත්තේ මෙරට වියළි කලාපීය ප්‍රදේශය යි. කෘෂි කර්මාන්තයට යෝග්‍ය භෞතික හා ස්වභාවික සම්පත් කලාපයේ නොමඳව පිහිටා තිබීම එයට හේතු වී තිබේ. එසේ වුවද වී වගාවට අවශ්‍ය ජලය උවමනා විටක සම්පාදනය කරගැනීම මෙම කලාපයේ පැවති ප්‍රධාන අභියෝගය විය. එයට හේතුවී ඇත්තේ මෙම කලාපයේ පවතින දීර්ඝ කාලීන නියං සමය යි. ජනාවාස ව්‍යාප්තව පැවති වියළි කලාපය ආවරණය වන පරිදි ක්‍රමවත් වාරි කර්මාන්ත ජාලයක් සෑදූ රාජ්‍ය මැදිහත්වීම මත ක්‍රමිකව ගොඩනැගීම කෙරෙහි මෙම හේතුව බලපා තිබේ. මෙම පර්යේෂණ පත්‍රිකාව මගින් ඉදිරිපත් කිරීමට අපේක්‍ෂා කරනු ලබන්නේ පැරණි ශ්‍රී ලංකාවේ වියළි කලාපීය ජල කළමනාකරණයේ සුවිශේෂිතාව සම්බන්ධයෙන් මෙතෙක් සිදුකරන ලද ක්‍ෂෙත්‍ර පර්යේෂණයන්ගෙන් අනාවරණය කරගත් තොරතුරුවල විශ්ලේෂණයකි.

## ක්‍රමවේදය

මෙම පර්යේෂණයට ප්‍රධාන වශයෙන් පදනම් වී ඇත්තේ වියළි කලාපීය ප්‍රදේශයේ සිදුකරන ලද ක්‍ෂෙත්‍ර ගවේශනයන් මගින් ලබාගත් තොරතුරු ය. ඊට අමතරව පුරාවිද්‍යාත්මක හා අභිලේඛන ඇතුළු විවිධ මූලාශ්‍ර ද මේ සඳහා දායක කරගෙන තිබේ.

## ප්‍රතිඵල

වියළි කලාපීය ජල මාර්ග ආශ්‍රිතව කෘෂි බිම් පිහිටුවාගත් මෙරට මුල් කාලීන ජනතාව ප්‍රථමයෙන් ප්‍රාථමික වැටි, වේලි ආදිය යොදාගනිමින් ජල මාර්ගවල ගලායන ජලය ප්‍රයෝජනයට ගත්තේය. එම ක්‍රමවේදය ප්‍රමාණවත් නොවන විටදී වගාවට අවශ්‍ය කෘත්‍රිම ජල සම්පාදනය සඳහා පැරණි වියළි කලාපීය ජනතාව මුලින්ම ගම් වැව් ඉදිකර තිබේ. ක්‍රමයෙන් ජනගහනය අධිකවත් ම විශාල භූමි ප්‍රදේශයන් ආවරණය වන පරිදි විශාල වැව් සහ අමුණු සහිත වඩාත් දියුණු වාරි ක්‍රම තැනීම කෙරෙහි අවධානය යොමුකර ඇත. ක්‍රිස්තු පූර්ව පළමු වන සියවසේ ආරම්භව ක්‍රිස්තු වර්ෂ දහතුන්වන සියවස තෙක් පැවති මෙම ජලාශ්‍රිත ශිෂ්ටාචාරය ප්‍රධාන වශයෙන් අනුරාධපුර හා පොළොන්නරු රාජධානි සමය නියෝජනය කරයි.

වියළි කලාපීය ජල කළමනාකරණය සම්බන්ධයෙන් අවධානය යොමුකිරීමේදී පැහැදිලි වන්නේ ජලය හැකි උපරිම ආකාරයෙන් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කර තිබෙන බවයි. එම ක්‍රමවේදය

- වැව් පදනම් කරගත් ජල කළමනාකරණය
- අමුණු පදනම් කරගත් ජල කළමනාකරණය

යන ජල කළමනාකරණ ක්‍ෂෙත්‍ර ඔස්සේ විමර්ශනය කළ හැකි වුවද වියළි කලාපයේ වාරි කර්මාන්ත ජාලය ක්‍රමවත් ව විකාශනය වීම වැව් සහ අමුණු යන ක්‍ෂෙත්‍ර දෙකෙහිම ඒකාබද්ධවීම මත සිදුවී ඇති බව හඳුනාගත හැකි ය. වියළි කාලාපීය පැරණි වාරි කර්මාන්තය තුළ හඳුනාගත හැකි ප්‍රධාන ලක්‍ෂණය වන්නේ ජලය හැකි තරම් දුරට අරපිරිමැස්මෙන් යුතුව නැවත නැවත ප්‍රයෝජනයට ගත හැකිවන පරිදි වාරි ක්‍රම ගොඩනගා තිබීම ය. දැදුරු ඔය, කලා ඔය, මල්වතු ඔය, යාන් ඔය,

කුඹුක්කන් ඔය, කිරිඳි ඔය වැනි වියළි කලාපීය ජල මාර්ගවල දක්නට ලැබෙන අමුණු ඉදිකිරීම් රටාව මෙයට නිදසුනකි. එක් අමුණකින් වෙනතකට හරවා භාවිතයට ගන්නා ජලය තවත් අමුණකට පෙරාතුව නැවත ජල මාර්ගයට එකතුකොට යළි ප්‍රයෝජනයට ගත හැකි වන පරිදි එම අමුණු සැළසුම් කර තිබේ. මීට අමතරව වියළි කලාපයේ දක්නට ලැබෙන එල්ලංගා පද්ධති ලෙස හඳුන්වන වාරි පද්ධතිය ද ඉහත අරමුණ සඳහා සකස් කරන ලද්දක් විය. ඉහළ සිට පහළට එකිනෙක බද්ධ වූ වැව් ජාලයක් ලෙස මෙම වාරි ක්‍රමය ගොඩනගා තිබේ. අහස් ජලය සුරක්ෂිත කොට ප්‍රයෝජනයට ගැනීම මෙහි ප්‍රධාන අරමුණකි. සඳමල් එළිය, කහගොල්ලෑව, පුරාණ හල්මිල්ලෑව, නවෝදාගම, පුවරසන්කුලම වැනි ප්‍රදේශ ආශ්‍රිත ව මෙවැනි එල්ලංගා පද්ධති හඳුනාගත හැකිය. දුදුරු ඔය පහළ නිම්නබද ප්‍රදේශය ආශ්‍රිතව ද මෙවැනි එල්ලංගා පද්ධති ක්‍රියාත්මක වී ඇත.

අවශ්‍යතාව මත පදනම්ව ලබාගත් අත්දැකීම් මූලික කරගෙන ගොඩනැගුණු වියළි කලාපීය වාරි කර්මාන්තය තුළ ඊටම සුවිශේෂී වූ තාක්ෂණික ක්‍රම වේදයක් හඳුනාගැනීමට පුළුවන. , එය ශ්‍රී ලංකාවේ වියළි කලාපීය ජල කළමනාකරණයේ අනන්‍යතාව පෙන්නුම් කරන්නකි. එහි පවතින විශේෂත්වය වන්නේ හැකි උපරිම ආකාරයෙන් පරිසර හිතකාමී ලෙස සැලසුම් කර තිබීමයි. භූමියේ වඩාත් යෝග්‍ය තැන ස්ථානගත කර තිබීම, අවශ්‍යතාව මැනවින් හඳුනාගැනීම, භූමියට හා වාරි ක්‍රමවේදයට ගැලපෙන තාක්ෂණය හා ශිල්ප ක්‍රම උපරිම ලෙස භාවිත කිරීම වියළි කලාපීය පැරණි වාරි නිර්මාණ සම්බන්ධයෙන් හඳුනාගත හැකි වැදගත් ලක්ෂණයන්ය. එම වාරි නිර්මාණවල කාර්යක්ෂමතාව උපරිම තත්ත්වයෙන් පවත්වාගෙන යනු ලැබූ බවට සාක්ෂි හඳුනාගත හැකි ය. එහි ප්‍රතිඵල ජනතාවට ලැබුණු බව පුරාවිද්‍යාත්මක හා අභිලේඛන ඇතුළු විවිධ මූලාශ්‍රවලින් ලැබෙන තොරතුරු වලින් නිගමනය කළ හැකිය.

වියළි කලාපීය පුරාණ ජලාශ්‍රිත ශිෂ්ටාචාරය තුළ හඳුනාගත හැකි ප්‍රධාන ලක්ෂණ ගණනාවක් වේ. භූගත ජලය ගොවිතැනට භාවිත නොකොට එය සුරක්ෂිත කිරීම, අවදානම් අඩු ගොවිතැන් ක්‍රම සඳහා කන්න රටාව අනුගමනය කිරීම, පරිසරය සුරක්ෂිත කිරීම හා පෝෂණය කිරීම, නෙළාගත් වැසි ජලය සුරක්ෂිත කොට භාවිත කිරීම, සාමූහික ක්‍රියාකාරකම්, අස්වැන්න ගබඩා කිරීම හා පසු අස්වනු කළමනාකරණය, දැනුම අත්දැකීම් ඔස්සේ ඊළඟ පරපුරට උරුම කර දීම වැනි ක්ෂේත්‍රයන් ඒ අතර දක්නට ලැබේ.

**නිගමනය**

'අවශ්‍යතාව සපුරාගැනීම' යන සංකල්පය මත ගොඩනැගුණු වියළි කලාපීය වාරි කර්මාන්තය අත්දැකීම් පාදක කරගත් ක්‍රියාවලියක විශිෂ්ඨ ප්‍රතිඵලයකි. එම වාරි පද්ධතිය උපරිම තත්ත්වයෙන් ක්‍රියාත්මක වූ අවදියේ එහි ප්‍රතිඵල ජනතාවට මෙන් ම පරිසරය ට ද යහපත් ආකාරයෙන් බලපා තිබෙන බව අනාවරණය කරගනු ලැබූ අවශේෂාත්මක සාධක මගින් නිගමනය කිරීමට පුළුවන.